සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2020
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**
- දී ඇති ස්ථානයේ ඔබගේ අංකය ලියන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

(01) අල්කුර්ආනයේ ප්‍රථම වාක්‍ය පහ පහල කළ ස්ථානය කුමක්ද?
(1) තව්ර් ගුහාව (2) හීරා ගුහාව (3) උහුද් කන්ද (4) කඃබාව

(02) නබි (සල්) තුමාගේ මිහ්රාජ් ගමන සැකයකින් තොරව ප්‍රථමයෙන් සත්‍යයක් ලෙස පිළිගත් සහාබිවරයා කවුරුන්ද?
(1) අබූබක්කර් (රළි) (2) උමර් (රළි) (3) උස්මාන් (රළි) (4) අලි (රළි)

(03) පරලොවේදී ගැත්තා වෙනුවෙන් අල්ලාහ්ට බැගෑපත්වන කරුණු දෙක කුමක්ද?
(1) සලාතය සහ දික්රය (2) උපවාසය හා හජ්
(3) සලාතය හා උපවාසය (4) උපවාසය හා අල්කුර්ආනය

(04) පොළොන්නරු රාජධානි සමයේ මහා පරාක්‍රමබාහු රජතුමාගේ රාජ සභාවේ සිටි මුස්ලිම්වරු හතරදෙනාගේ සේවය කුමක්ද?
(1) අරක්කැමියන් ලෙස සේවය කිරීම (2) රාජ ආරක්ෂක සේවය
(3) ව්‍යාපාර උපදේශක ලෙස සේවය කිරීම (4) ඇඳුම් මැසීම පිළිබඳ සේවය

(05) මුජ්තහිද්වරයකු ඉජ්තිහාදය කර ඔහුගේ තීන්දුව වැරදි වුයේ නම් ඔහුට හිමි වන්නේ කුමක්ද?
(1) ඔහුට පින් දෙකක් හිමි වේ
(2) ඔහුට එක් පිනක් හිමි වේ
(3) ඔහුට පරලොවේදී දඬුවම් ලැබේ
(4) ඔහුට මෙලොව හා පරලොව දඬුවම් ලැබේ

(06) හාජිවරයෙක් හජ් වගකීම් සියල්ල ඉටු කිරීමෙන් පසු ගමට හෝ මදීනාවට යෑමට පෙර අවසාන ලෙස ඉටු කළ යුතු තවාෆය කුමක්ද?
(1) තවාෆුල් කුදූම් (2) තවාෆුල් ඉෆාලා (3) තවාෆුල් විදා (4) තවාෆුල් හජ්

(07) තරුණයනි නුඹලාගෙන් ශක්තිවන්තයින් විවාහ වන්න ශක්ති නොමැති පුද්ගලයන්ට නබි තුමාගේ උපදේශය වන්නේ කුමක්ද?

(1) ඔවුන් පතිවත ආරක්ෂා කළ යුතුයි. (2) ඔවුන් ඉබාදතයේ රැඳී සිටිය යුතුයි
(3) ඔවුන් තපස් ජීවිතයේ රැඳී සිටිය යුතුයි. (4) ඔවුන් උපවාසය රකිත්වා

08) මුස්ලිම්වරයකු තුළ සකාත් වගකීම ඉටු කිරීම නිසා සිදුවන වෙනස කුමක්ද?

(1) මෙලොව ආසාව වැඩිවේ (2) ශරීරය නිරෝගී වෙයි
(3) ඔහුගේ දේපල හා ඔහු පාරිශුද්ධ වේ (4) ඔහුගේ ගෞරව හා යහගුණාංග වැඩි වේ

(09) අල්කුර්ආනය ඉදිරියේ තම නොහැකියාව පිළිගෙන කවි කීමෙන් වැළකී සිටි කවියා කවුරුන්ද?

(1) ඉම්රාවුල් කෛස් (2) දර්බා (3) අත්දරා (4) ලබිද් ඉබ්නු අඃසම්

(10) මුඃජිසාත් නැවති හාස්කම් ලැබූවන් කවුරුන්ද?

(1) මැලක්වරු (2) නබිවරු (3) අව්ලියාවරු (4) ජින්වරු

(11) පහත සඳහන් අරාබි පද අතර ආධ්‍යාත්මික ගුණාංග හා සම්බන්ධ වන වචන අඩංගු කාණ්ඩය තෝරන්න.

A මහර් B තව්බා C ඉල්හාද් D රිලා E නිසාබ්
F සුහුද් G තවක්කුල් H හීරා

(1) ABCD (2) BDFG (3) DFGH (4) GCHF

(12) වහී මත්ලුව් යටතේ ලද නීති මූලාශ්‍රය කුමක්ද?

(1) අල්කුර්ආන් (2) අස්සුන්නාහ් (3) ඉජ්මා (4) ඉජ්තිහාද්

(13) පහත සඳහන් වාක්‍ය අතරින් කලීෆා උමර් (රලි)තුමා කළ සේවය කුමක්ද?

(1) හිජ්රි දින දර්ශනය හඳුන්වා දීම (2) අල්කුර්ආනය ගොනු කිරීම
(3) මුසෙලමාට විරුද්ධවීම (4) බිර් රූමා වක්ෆ් කිරීම

(14) විවාහයකදී ෂාහිද් කෙනකුට තිබිය යුතු සුදුසකම් කුමක්ද?

(1) ඔහු විවාහකයකු වීම (2) ඔහු මනමාලියගේ සමීප ඥාතියෙකු වීම
(3) ඔහු අරාබි භාෂාව දත් කෙනෙකු වීම (4) ඔහු ගිවිසුම ඇති කරන භාෂාව දැන සිටිය යුතුයි

(15) පහත සඳහන් වගුවේ ''අ'' තීරයේ නබිවරුන්ගේ නම්ද ''ආ'' තීරුවේ ඔවුන්ගේ රැකියාවන්ද සඳහන් වේ.

| අ | ආ |
|---|---|
| 1. ඉද්රීස් (අලෛ) | A වඩු වැඩ |
| 2. නූහ් (අලෛ) | B එඬේර |
| 3. දාවූද් (අලෛ) | C මැහුම් |
| 4. මුහම්මද් (සල්) | D යකඩ මෙලෙක් කිරීම |

ඉහත අ තීරුවට ගැළපෙන ලෙස 'ආ' තීරුව සැසඳූ විට ගැළපෙන නිවැරදි පිළිතුර වන්නේ කුමක්ද?

(1) ABCD (2) BCAD (3) CADB (4) DCAB

(16) තම සැමියාට තෘප්තිමත් ලෙස මියැදන බිරිඳට ලැබෙන ආනිසංස පිළිබඳ නබි (සල්)තුමා කෙසේ පැවසුවේද?
(1) ඇය ස්වර්ගයට පිවිසේ (2) ඇයගේ පව් කමා කරනු ලැබේ
(3) ඇය ධනපතිනියකු ලෙස වෙනස් වේ (4) ඇයගේ දෙමාපියන් ස්වර්ගයට පිවිසේ

(17) පහත සඳහන් අයගෙන් පුරුෂයකුට අජ්නබි වන්නේ කවුරුන්ද?
(1) බිරිඳගේ මව (2) පුතාගේ බිරිඳ (3) නැන්දාගේ දියණිය (4) දුවගේ දුව

(18) ''අල්ලාහ් අප දෙදෙනා ඔබට අවනත වන මුස්ලිම්වරුන් බවට පත් කරනු තවද අපගේ පරම්පරාවෙන් ඔබට අවනත වන මුස්ලිම් උම්මතය බිහි කරනු මැන'' යැයි ප්‍රාර්ථනා කළ නබිවරුන් දෙදෙනා කවුරුන්ද?
(1) ආදම් (අලෛ), නුහ් (අලෛ) (2) ඉබ්‍රාහීම් (අලෛ), ඉස්මායිල් (අලෛ)
(3) මුසා (අලෛ), හාරූන් (අලෛ) (4) දාවුද් (අලෛ), සුලෙයිමාන් (අලෛ)

(19) විවාහයට පසු මනමාලයා විසින් ලබා දෙන සංග්‍රහය කෙසේ හැඳින්වේද?
(1) ෆිත්රා (2) වලිමා (3) අකීකා (4) ඉෆ්තාර්

(20) කුරෛෂිවරුන්ගේ වදහිංසා වලින් බේරීමට ආරක්ෂාව සොයා ගිය සහබාවරුන්ට පිහිට වූ රජතුමා කවුරුන්ද?
(1) අබ්රහා (2) හිරක්කල් (3) නජ්ජාසි (4) මුකව්කස්

(21) ලංකාවේ අතීතයේ මුස්ලිම්වරුන් විසින් හඳුන්වාදුන් තවලම යනු කුමක්ද?
(1) එය එක් ආකාරයක ගමනාගමන ක්‍රමයක්
(2) එය එක් වෛද්‍ය ක්‍රමයකි
(3) එය එක් පේෂකර්මාන්තයකි
(4) එය එක් වෙළඳ ක්‍රමයකි

(22) ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන දියුණුව උදෙසා සිද්දි ලෙබ්බෙ විද්වතා විසින් ආරම්භ කළ පුවත්පත කුමක්ද?
(1) මුස්ලිම් නේෂන් (2) රහ්මත්
(4) සමරසම් (4) ඉස්ලාමීය චින්තනය

(23) අල්ලාහ් වෙත ඉතාශ්‍රේෂ්ඨ හා අල්ලාහ්ට ඉතාමත් කැමති තැනැත්තා යනුවෙන් නබි(සල්)තුමා පවසා ඇත්තේ කවුරුන්ද?
(1) බෙලහීන මූඃමින්වරයා (2) රෝගී මූඃමින්වරයා
(3) බලසම්පන්න මූඃමින්වරයා (4) නිරෝගිමත් මූඃමින්වරයා

(24) ලොවේ සමානාත්මතාවය හා සහෝදරත්වය එළිදක්වන ඉබාදය කුමක්ද?
(1) සලාතය (2) සව්ම් (3) සකාතය (4) හජ්

(25) මුසා (අලෛ) තුමාගේ සතුරා වූ නයිල් නදියේ ගිලී මිය ගිය තැනැත්තා කවුරුන්ද?
(1) අබ්රහා (2) නුම්රූද් (3) පිර්අවුන් (4) හාරූන්

(26) පහත සඳහන් වගුවේ ''අ'' තීරුවේ පද ''ආ'' තීරුවත් සමඟ ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. ඉජ්මා | A පෙර හුරුපුරුදු රැකීම |
| 2. කියාස් | B සසඳ බැලීම |
| 3. උර්ෆ් | C සමාජ සුභසාධනය රැකීම |
| 4. මස්ලහා මුර්සලා | D ඒකමතික තීරණය |

(1) ABDC (2) BACD (3) CBAD (4) DBAC

(27) සැබෑ වීරයා ලෙස නබි(සල්)තුමා විසින් වර්ණනා කලේ කවුරුන්ද?
(1) තරහ පාලනය කරගන්නා (2) සටන් බිමේදී පලා නොයන්නා
(3) සතුරාට සමීපව සිට සටන් කරන්නා (4) දුෂ්කර අවස්ථාවේ ඉවසීම දරා ගන්නා

(28) අල්කුර්ආනයට පසු තත්වයේ ඇති හදීස් ග්‍රන්ථය කුමක්ද?
(1) අමල් හි ශ්‍රේෂ්ඨත්වය (2) රියාලුස් සාලිහීන්
(3) අරබවුන් අන්නවම් (4) සහීහුල් බුහාරි

(29) ශ්‍රී ලංකාවේ හා ඉන්දුනීසියාවේ මුස්ලිම්වරු වැඩි වශයෙන් පිළිගන්නා මද්හබය කුමක්ද?
(1) ෂාෆි (2) හනෆි (3) මාලිකි (4) හන්බලි

(30) පහත සඳහන් වාක්‍ය ඇසුරෙන් නිවැරදි වාක්‍ය තෝරන්න.
A තලාක් යනු බිරිඳ තම සැමියාගෙන් වෙන්වීමයි.
B ඊජාබ් - කබුල් විවාහය සමඟ සම්බන්ධ වේ.
C තලාක් පැවසූ කාන්තාව ඉද්දා සිටිය යුතුයි.
D මනමාලිය විසින් මනමාලයාට දෙන ලද ආධාරය මහර් වේ.

(1) A,B පමණක් නිවැරදි වේ. (2) B,C පමණක් නිවැරදි වේ.
(3) A,C පමණක් නිවැරදි වේ. (4) B,D පමණක් නිවැරදි වේ.

(31) ඉජ්තිහාදය නිසා බිහිවූ කලාව කුමක්ද?
(1) හදීස් කලාව (2) ෆික්හ් කලාව (3) තෆ්සීර් කලාව (4) තජ්වීද් කලාව

(32) ඉමාමුල් අඃලම් යන ගෞරව නාමයෙන් හඳුන්වන්නේ කවුරුන්ද?
(1) ඉමාම් ෂාෆි (රහ්) (2) ඉමාම් මාලික් (රහ්)
(3) ඉමාම් අහ්මද් (රහ්) (4) ඉමාම් අබූ හනීෆා (රහ්)

(33) නබි(සල්)තුමාට පසු කිලාෆතය භාරගත්තේ කවුරුන්ද?
(1) අබු බක්කර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රළි) (4) අලි (රළි)

(34) පාපයක් සිදු වේ දෝ යන බියෙන් වරදක් නොවන දේද සිදු නොකර සිටීම හඳුන්වන්නේ කෙසේද?
(1) සුහුද් (2) වරඋ (3) රිලා (4) තවක්කුල්

(35) නබි(සල්)තුමාට පහළ කළ වහී ලියා ආරක්ෂා කළ අය හඳුන්වන්නේ කෙසේද?
(1) කලීෆාවරු (2) තාබිඊන්වරු (3) අහ්ලුල් කිතාබ්වරු (4) කුත්තාබුල් වහීවරු

(36) මෙලොව අල්ලාහ්තආලාට බාල එකක් බව පෙන්වීමට නබි(සල්)තුමා යොදාගත් ක්‍රමය කුමක්ද?
(1) මින්බර්යේ නැගී පැහැදිලි කිරීම
(2) මැරුණු එළුවාගේ හිස ඔසවා පෙන්වා පැහැදිලි කිරීම
(3) කඳු මුදුනක නැග පැහැදිලි කිරීම
(4) පොළොවේ ඉරි ඇඳ පැහැදිලි කිරීම

(37) අල්කුර්ආන්හි මුඃමින්වරුන් හට ''ඔබත් ඔබේ පවුලත් රැක ගන්න'' යයි අණ කරන්නේ කුමකින් රැක ගැනීමට ද?
(1) රෝග වලින් (2) දුප්පත්කමින්
(3) නිරයේ ගින්දර වලින් (4) ඊර්ෂියාවෙන්

(38) භාණ්ඩයක් විකුණන විට විකුණන්නා ලබන ලාභය ගැණුම්කරු විසින් හොඳින් වටහා ගැනීමට හැකි ව්‍යාපාර ක්‍රමය කුමක්ද?
(1) කර්ල් හසනී (2) මුෂාරකා (3) මුලාරබා (4) මුරාබහා

(39) පහත සඳහන් අය ඇසුරෙන් ස්ත්‍රියක සඳහා වලී වශයෙන් පෙනී සිටීමට නොහැකි අය කවුරුන්ද?
(1) මවගේ සහෝදරයා (2) පියා
(3) පියාගේ පියා (4) එක කුස උපන් සහෝදරයා

(40) අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ ප්‍රයත්නයේ නායකයා කවුරුන්ද?
(1) අබූ බක්කර් (රලි) (2) උමර් (රලි)
(3) සෙයිද් ඉබ්නු සාබිත් (4) අලි (රලි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙකුත් එක් එක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින්ද හිමිවේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (1) ''වහී'' හී ප්‍රධාන වර්ග දෙක ලියන්න.

(2) සලාත් හි සුජූදයේදී පාරායනා කළ යුතු දුආව ඔබගේ භාෂාවෙන් ලියන්න.

(3) 'හදීස්' හී වර්ග දෙක නම් කරන්න.

(4) වහී ඇසුරෙන් ලබාගත් නීති මූලාශ්‍ර දෙක සඳහන් කරන්න.

(5) මද්රසතුල් අසර්, මද්රසතුල් රඃයු දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.

(6) වන්දනාමාන කිරීමට අනුමැතිය ලද සිද්ධස්ථාන දෙකක් නම් කරන්න.

(7) ඉස්ලාමීය අකීදාවට පටහැනි කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(8) නබි(සල්)තුමාගේ ජීවිත කථාව සඳහන් පුරාථන ග්‍රන්ථ දෙක නම් කරන්න.

(9) සකාත් ලැබීමට සුදුසුකම් ලද අය අතරින් ෆකීර්, මිස්කීන් හි වෙනස පැහැදිලි කරන්න.

(10) සව්මයේ ෆර්ලු දෙක ලියන්න.

(02) නීති මූලාශ්‍ර ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කරන ප්‍රධාන ආකාර දෙක ලියන්න.

(ii) ප්‍රථම "මුස්හෆ්" ගොනු කිරීමේ ඉතිහාසය කෙටියෙන් පහදන්න.

(iii) හදීස් ආරක්ෂා කිරීම සඳහා යොදා ගත් ක්‍රියා මාර්ග කෙටියෙන් පහදන්න.

(03) විවාහය සම්බන්ධව පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) මහ්රම්, අජ්නබි පිළිබඳව කෙටියෙන් පහදන්න.

(ii) ෂරීආවේ දෘක්මෙන් විවාහයේ අරමුණු තුන කෙටියෙන් ලියන්න.

(iii) ආදර්ශවත් මුස්ලිම් පවුලේ දෙමාපියන් සතු වගකීම් පහක් නම් කර විස්තර කරන්න.

(04) ඉස්ලාමීය ආර්ථිකය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) ඉපයීමේ වැදගත්කම සඳහන් අල්කුර්ආන් වැකියක අර්ථය ලියන්න.

(ii) ඉස්ලාමීය ආර්ථික ක්‍රමය වැදගත් වීමට අවශ්‍ය කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) වෙළඳාමේදී විකුණන්නා සහ මිල දී ගන්නා ඉස්ලාමීය මූලික සිද්ධාන්ත රැකගෙන කටයුතු කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පහක් ලියන්න.

(05) ඉස්ලාමීය ඉතිහාසය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) කලීෆා අබුබක්කර් (රළි) තුමා කලීෆා ලෙස තේරී පත්වූ ක්‍රමය කෙටියෙන් පහදන්න.

(ii) කලීෆා උස්මාන් (රලි) තුමාගේ ප්‍රධාන සේවාවන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) ඉස්ලාම් දහම හඳුන්වා දීමට පෙර සිටම අරාබියාව හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධතාවය ඇති වීමට හේතු වූ කාරණා පහක් සඳහන් කරන්න.

(06) නීතිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) හදීස් යනු කුමක්ද?

(ii) මුජ්තහිද්වරුන්ගේ සුදුසුකම් කෙටියෙන් විස්තර කරන්න.

(iii) කියාස් හි අර්කාන් හතර කෙටියෙන් පහදන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වන්දමාන කිරීමට අනුමත පූජනීය ස්ථාන.

(ii) මෙලොව ජීවිතය පිළිබඳව ඉස්ලාමීය දැක්ම.

(iii) ඉද්දාවේ දී අනුගමනය කළ යුතු දේ.

(iv) යහගුණ වර්ධනය කිරීමේ මූලික ඉබාදතයන්.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
වර්ෂ අවසාන පරීක්ෂණය - 2020

ශ්‍රේණිය 11 විෂයය ඉස්ලාම් කාලය පැය 03යි

ලකුණු ක්‍රමය

2 කොටස

1.

I. වහී මත්ලුව්වූ , වහී කෛරු මත්ලුව්වූ
II. සුබහාන රබ්බියල් අෑලා වබිහම්දිහී
III. සුළු කිල්ල (වුළු කිරීම) , මහා කිල්ල (ස්නානය)
IV. අල්කුර්ආන් , අස්සුන්නාහ්
V. අසර් - අල්කුර්ආන් සුන්නාහ් මත පදනම් වූ
රෑයූ - තීක්ෂණ ඥානයමගින් විසඳුම් ලබාදීම
VI. කෑබා , මස්ජිදුල් නබවි , මස්ජිදුල් අක්සා
VII. මුෘතසිලා , කවාරිජ් , ජබරිය්‍යා
VIII. සීරතු රසූලුල්ලාහ් , අර් රසීදුල් මක්දූම්
IX. ෆකීර් - කිසිම ආදායමක් නොමැත්තා
මිස්කින් - ප්‍රමාණවත් ආදායමක් නොමැත්තා
X. නිය්‍යත් තැබීම
අලුයම සිට හිරු බැස යන තුරු ආහාර පාන ගැනීම , ශාරීරික සබඳතා පැවැත්වීම වැනි අනුමත ක්‍රියා වලින් වැළකී සිටීම.

(2*10=20)

2.

I. කුර්ආන් නීතිය සෘජුව ලබා දෙයි.
නීතියට අදාල පදනම ලබා දී එමගින් නීතිය ලබා ගැනීමට අවස්ථාව ලබා දීම.

II. කලීෆා අබුබක්කර් (රලි) තුමාගේ කාලයේ හාෆිල් වරුන් මියයාමත් සමග කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවය උමර් (රලි) තුමා ගෙන හැර දක්වා , ග්‍රන්ථාරූඪ කිරීමේ සේවයට අදාළ නායකත්වය සෛද් ඉබ්නු සාබිත් (රලි) තුමාට පවරා ලිවීම. එයට අදාළ සාක්ෂිආදිය පදනම් කර ගනිමින් පළමු මුස්හෆ් පිළියෙළ කිරීම.
III. පහත ආකාරයට හදීස් ආරක්ෂා විය.
- සහාබාවරු හදීස් කට පාඩම් කර ආරක්ෂා කළහ.
- සමහරු ලියා කටපාඩම් කළහ.
- හදීස් ක්‍රියාවට නංවා ආරක්ෂා කළහ.
- අස්හාබුස් සුෆ්ෆාවරු හදීස් ඉගෙනගෙන ඉගැන්වූහ.
- හදීස් ගොනු කර ග්‍රන්ථ එළි දැක්වීම.
- හදීස් ඉගැන්වීමේ පන්ති පැවැත්වීම.
- හදීස් ශ්‍රේෂ්ඨත්වයට පත් කර ශ්‍රේණි ගත කරන ලදී.

(2+3+5=10)

3.

I. මහ්රම් - පවුලේ නෑකම , විවාහක නෑකම නැතිනම් කිරි බීමේ නෑකම හේතුවෙන් කාන්තාවකට හෝ පුරුෂයකුට විවාහ වීමට තහනම් කල අය.

අජ්නබි - පිටස්තර අය , සමීප ඥාතීන් නොවන අය , විවාහ වීමට අනුමත කල අය. මෙවැනි අය ස්පර්ශ කල නොහැකිය. මොවුන් සමග තනිව ගමනක් යාමට හෝ තනිව සිටීමට හෝ අවසර නොමැත.

II.

- සාලිහීන් වූ පරපුරක් බිහි කිරීම.
- ශාරීරික හා මානසික සහනය ලබා දේ.
- යහපත් සමාජයක් ගොඩනැගීමට හේතුවීම.

III.

- දරුවන් සමග ආදරයෙන් කටයුතු කරයි.
- පවුල වෙනුවෙන් හැකි පමණ වියදම් කරයි.
- හොඳ අධ්‍යාපනයක් ලබා ගනී.
- ලේ නෑකම රැකගෙන හැසිරෙයි.
  යහපත් හැසිරීම , නිරෝගී බව ආදිය ලබා දෙයි

(2+3+5=10)

4.

I. "ජමාඅත් සලාතය අවසන් වූ පසු භූමියේ විසිර ගොස් අල්ලාහ්ගේ දයාව ලබා ගන්න"(62:10)

II.

- ඉපයීම අල්ලාහ්ගේ දයාව සෙවීමේ උත්සාහයකි.
- ඉපයීම මුස්ලිම්වරයෙකුට අනිවාර්ය වූ දෙයකි.
- ඉපයීම නැමදුමකි.(කෙටියෙන් පැහැදිලි කිරීම

III.

- ඔවුන්ගේ ගනුදෙනු කටයුතු නැමදුමක් වේ.
- ගැනුම්කරු හා විකුණුම්කරු අතර නෑකම රැකේ.
- ව්‍යාපාරයේ ස්ථාවර බව හිමි වේ.
- අනවශ්‍ය දෝෂාරෝපණ වලින් ආරක්ෂාව හිමි වේ.
- හරාම් වූ ගනුදෙනු වලින් මිදීමට හැකි වේ.

(2+3+5=10)

5.

I. නබි තුමාගේ වෆාඅතය සමග සකීෆතු බක සාහිදාහි සහාබාවරු එක් රැස් වී අබූබක්කර් (රළි) තුමාව කලීෆා ලෙස තෝරා ගෙන බයිඅත් කිරීම.

II.

- අල්කුර්ආනයේ පිටපත් ලියා කුර්ආනය පාරායනය කිරීමෙහි ඒකරාශී කළේය.
- නාවික හමුදාව ස්ථාපිත කළේය.(මුආවියා රළිගේ නායකත්වයෙන්)
- පාලන තන්ත්‍රය පුළුල් කළේය. (ඊජිප්තුව, ටියුනීසියාව, මොරොක්කෝව , අප්‍රිකාව)
- මස්ජිදුල් නබවිය පුළුල් කළේය.

III.

- නැගෙනහිර හා බටහිර යා කල සේද මාර්ගයේ ශ්‍රීලංකාව පිහිටා තිබීම.
- ආරක්ෂිත වරාය පහසුකම්.
- ආහාර හා පානීය ජල පහසුකම්.
- නැව් අලුත්වැඩියා කිරීමේ පහසුකම්.
- වෙළඳ භාණ්ඩ දක්නට ලැබීම.

(2+3+5=10)

6.

I. නබි (සල්) තුමාගේ වචන , ක්‍රියා හා අනුමැතිය

II.

- අල්කුර්ආන් සුන්නාහ් පිළිබඳ ගැඹුරු දැනුම
- ඒ හා සම්බන්ධ කලාවන්හි දැනුම
- පෙර සිදු වූ ඉජ්තිහාද් පිළිබඳ දැනුම
- සොයා ගැනීම සඳහා මතු වූ ගැටලුව පිළිබඳ පැහැදීමක් තිබීම
- තක්වා හා යහපත් හැසිරීම

III.

- අල් අස්ල් - (මෙයට පෙර තීන්දු කරන ලද ගැටළුව) රට ඉඳි , මත්පැන්
- අල් ෆර්උ - (විසඳුම සෙවිය යුතු ගැටළුව)
- අල් ඉල්ලත් - (ප්‍රශ්නය අතර දක්නට ලැබෙන මත්වන ගතිය)
- අල් හුකම් - (තීන්දුව)

(2+3+5=10)

7.

I.

- පුජනීය ස්ථාන තුන. මස්ජිදුල් අක්සා , මස්ජිදුල් නබවි , කඃබා
- මෙහි වැදගත්කම පිළිබද අල්කුර්ආන් අල්හදීස් උපදෙස්
- මෙහි ඉටු කරන යහ ක්‍රියා සදහා වූ කුසලය
- මේවා නිර්මාණය කල අය
- මෙහි සැකැස්ම පිළිබද විස්තරය

II.

- මෙලොව පරලොවේ වගා බිම වේ.
- එහි ගැඹුරින් ගැලීම හෝ එය ප්‍රතික්ෂේප කිරීම හෝ නොකළ යුතුය.
- මෙලොව ජීවිතය අල්පමාන බව හඟවන වාක්‍යයන්
- මෙම වචන දෙක අතර සම්බන්ධය

III.

- ඉද්දා ආකාර තුනකි.
- ඉද්දා සිටින කාන්තාව තමා අලංකාර කර ගැනීම නොකළ යුතුය.
- විවාහ වීම හා විවාහ කතා බස් වල යෙදීම නොකළ යුතුය.
- ආභරණ පැළදීම නොකළ යුතුය.
- මිත්‍යා විශ්වාස වලින් වැළකී සිටීම.

IV.

- සලාතය - නින්දාසහගත වැරදී ක්‍රියා වලින් ආරක්ෂා කරයි.
- සකාත් - මසුරුකමින් හා ලෝබකමින් ආරක්ෂා කරයි.
- උපවාසය - දේව බිය හා යහ ගුණාංග වර්ධනය කරයි.
- හජ් - නරක වචන , කෝලාහල , අනවශ්‍ය විවාද වලින් ආරක්ෂා කරයි.
- අල්කුර්ආන් , අල්හදීස් මූලාශ්‍ර

(5+5=10)

මුළු ලකුණු
I කොටස = 40
II කොටස = 60
මුළු ලකුණු = 100

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk
online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371
















































# LOL.lk online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## කෙටි සටහන් පොත්













මිට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්ව ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE BOOK STORE



An evening of fun for young readers